විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මාලිගාවත්ත කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10.  மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10.  Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2010  දිනය / திகதி / Date 2010- 09- 07

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 8/2010**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් ,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ත්‍රිවිධ හමුදාපතිවරුන්,
දිසා ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්.

## ජීවන වියදම් දීමනාව එක් පුද්ගලයකුට කිහිප ආකාරයකින් ගෙවීම ප්‍රතිශෝධනය කිරීම

උක්ත කරුණට අදාලව නිකුත් කරන ලද 2008- 02- 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/ 2008 හා ඊට අනුරූපීව මවිසින් නිකුත් කරන ලද 2008- 07- 01 දිනැති විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ 4/ 2008, 2009- 02- 20 දිනැති විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ 7/ 2009 හා 2009- 12- 03 දිනැති 4/2008 හා 7/2009 (සංශෝධන) චක්‍රලේඛ උපදෙස් හා බැඳේ.

රාජ්‍ය සේවකයෙකු ලබන ජීවන වියදම් දීමනාව ඉක්මවා විශ්‍රාමිකයකුට ජීවන වියදම් දීමනාව නොගෙවන ලෙස උක්ත චක්‍රලේඛ මඟින් උපදෙස් ලබා දී තිබේ.

කෙසේ වෙතත් එම චක්‍රලේඛයන්හි සඳහන් උපදෙස් ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් නිසි පරිදි ක්‍රියාත්මක නොකරන බව මා වෙත වාර්තා වී ඇත. එබැවින් මේ සම්බන්ධව විශේෂ අවධානය යොමු කොට පහත සඳහන් පරිදි ක්‍රියාකළ යුතු බව මින් දන්වමි.

1) ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මියගිය අවිවාහක හමුදා නිලධාරීන්/ නිලධාරිණියන්, හමුදා සාමාජික/ සාමාජිකාවන්ගේ දෙමව්පියන් වෙත ඔවුන්ගේ මාසික වැටුප ගෙවනු ලබන අවස්ථාවේදී යැපෙන්නන්ගේ දීමනා සඳහා ජීවන වියදම් දීමනාව නොගෙවිය යුතුය. අදාල මාසික වැටුප දෙමව්පියන් වෙත බෙදා ගෙවන අවස්ථාවන්හිදීද ඔවුන්ට යැපෙන්නන්ගේ දීමනා සමඟ ජීවන වියදම් දීමනාව නොගෙවිය යුතුය.

| | Telephone | Fax | | Telephone | Fax | | Telephone | |
|---|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 | |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 | |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 | E-mail: pensions@sltnet.lk |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 | Web site: www.pensions.gov.lk |

2) ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මියගිය විවාහක හමුදා නිලධාරීන්/ නිලධාරිණියන්, සාමාජික/ සාමාජිකාවන්ගේ කලත්‍රයන් වෙත මාසික වැටුප ගෙවනු ලබන විට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප, යැපෙන්නන්ගේ දීමනා සඳහා ජීවන වියදම් දීමනාව නොගෙවිය යුතුය. තවද මියගිය අයගේ වැටුප දෙමව්පියන් හා කලත්‍රයන් අතර, බෙදී යන අවස්ථාවන්හිදීද අනෙකුත් දීමනා සමඟ ජීවන වියදම් දීමනාව නොගෙවිය යුතුය.

3) වයස අවු. 55 දක්වා සන්නද්ධ හමුදා මාසික වැටුප ලබමින් හමුදා සේවා විශ්‍රාම වැටුප, දුබලතා විශ්‍රාම වැටුප ලබන අය සිටින බැවින් ඔවුන් පිළිබඳව සවිස්තර වාර්තාව කඩිනමින් ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර, ඔවුන් වෙත ගෙවනු ලබන ජීවන වියදම් දීමනාව ගෙවීම නතර කළ යුතුය.

4) විශ්‍රාම වැටුප ලබමින් සංස්ථා, මණ්ඩල, අධිකාරී වැනි ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප සමඟ ගෙවනු ලබන ජීවන වියදම් දීමනාව ගෙවීම නතර කළ යුතුය. එවැනි අය පිළිබඳ ග්‍රාම නිලධාරී මඟින් වාර්තා ලබාගැනීම ප්‍රාදේශීය ලේකම්වරු විසින් සිදු කළ යුතුය.

5) ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මියගිය සන්නද්ධ හමුදා/ රාජ්‍ය සේවකයෙකුගේ අනත්දරුවන්ට මාසික වැටුප සමඟ අනත්දරු විශ්‍රාම වැටුප ගෙවනු ලබන අවස්ථාවන්හිදී අනත්දරු විශ්‍රාම වැටුප සමඟ ජීවන වියදම් දීමනාව නොගෙවිය යුතුය. (මාසික වැටුප අනත්දරුවන් කිහිප දෙනෙකු අතර බෙදී යන අවස්ථාවන්හිදී ද මෙ පරිදි කටයුතු කළ යුතුය)

6) රාජ්‍ය සේවකයකු තම මාසික වැටුප ලබමින් මියගිය තම දරුවන්ගේ/ ස්වාමි පුරුෂයන්ගේ/ බිරිඳගේ, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප/ වැන්දඹු පුරුෂ හා අනත්දරු වැටුප/ යැපෙන්නන්ගේ දීමනා ද ලබාගන්නා විට එකී දීමනා සඳහා ගෙවනු ලබන ජීවන වියදම් දීමනා ගෙවීම නතර කළ යුතුය.

7) මේ අනුව රාජ්‍ය සේවකයකු ලබන ජීවන වියදම් දීමනාව ඉක්මවා විශ්‍රාමිකයකු සඳහා ජීවන වියදම් දීමනාව නොගෙවිය යුතු බව අවධාරණය කරමි.

වැඩිපුර ගෙවා ඇති ජීවන වියදම් දීමනාව ආපසු අයකර ගැනීමේදී ගැටළු මතු වී ඇති බැවින් වැඩිපුර ගෙවා ඇති ජීවන වියදම් දීමනාව ආපසු අයකිරීම අත්හිටුවීමට කටයුතු කළ යුතු බව දක්වා ඇත.

එකී තීරණය වැඩිපුර ගෙවා ඇති ජීවන වියදම් දීමනාව ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් වන බැවින් මෙම චක්‍රලේඛයේ උපදෙස් 2009- 12- 03 දින සිට ක්‍රියාත්මක කළ යුතු බව අවධාරණය කරන අතර, 2009- 12- 03 දිනෙන් පසු වැඩිපුර ගෙවන ලද ජීවන වියදම් දීමනා ආපසු අයකිරීමට කටයුතු කළ යුතුය.

කේ. ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
04. අමාත්‍ය මණ්ඩල ලේකම්
03. විගණකාධිපති.